# දෙවුන්දර උපුල්වන් දේවාලය ආශ්‍රිත ජනශ්‍රැති

ධම්මික හේවගේ[1]

මාතර දිස්ත්‍රික්කයට අයත් දෙවුන්දර හෙවත් දෙවිනුවර උපුල්වන් දේවාලය දීර්ඝ ඉතිහාසයක් සහිත දේවාලයකි. මෙම දේවාලයෙහි ඉතිහාසය සහ ඊට අධිගෘහිත දෙවියන් පිළිබඳව ද බොහෝ මතභේද පවතී. මීට අමතර ව දෙවුන්දර ප්‍රදේශය අවට පිහිටා තිබූ වෙනත් දේවාල කිහිපයක නටබුන් ද හමු වේ. ඒ අනුව බහු දේව ඇදහීමක් තිබු දේවනගරයක් ලෙස අතීත දෙවුන්දර හඳුනා ගත හැකි ය. තම අතීත ඉඩම් භුක්තිය සුරක්ෂිත කරගනු වස් තම ඉඩම්වලින් හමු වූ පුරාවස්තු දෙවුන්දර ජනතාව විසින් අස්ථානගත කොට හෝ විනාශ කොට ඇත. වර්තමානයේ දී ද මෙම පුරාවස්තු සංහාරය සිදුවේ. දෙවුන්දර ඉතිහාසය හා අතීත විභූතිය විමසා බැලීම ද මෙතෙක් නොවැදගත් යැයි නොසලකා හරින ලද ජනශ්‍රැති දෙවුන්දර ඉතිහාසය ගොඩනැගීමෙහි ලා දායකකර ගැනීම මෙම අධ්‍යයනයෙන් අපේක්ෂා කෙරේ.

මෙතෙක් සංග්‍රහ නොකරන ලද වියැකෙමින් යන මුඛ පරම්පරාගත ඥානය (ජනශ්‍රැති) අධ්‍යයන කිරීම මෙහි ප්‍රධාන අරමුණ වේ. දෙවුන්දර දේවාලයට අධිගෘහිත දෙවියන් පිළිබඳ ව සාහිත්‍ය විමර්ශනාත්මක අධ්‍යයනයක් කිරීම මගින් ජනශ්‍රැති හා ද්විතීයික මුලාශ්‍ර අතර තුලනාත්මක සංවාදයක් ගොඩනැගීම දෙවැනි අරමුණ වේ. මේ සඳහා ප්‍රාථමික දත්ත ලබා ගැනීමට ව්‍යුහගත හා විවෘත සම්මුඛ සාකච්ඡා ක්‍රමය භාවිත කළ අතර ද්විතීයික දත්ත රැස්කිරීමේ දී ග්‍රන්ථ, පුවත්පත් වාර සඟරා භාවිත කරන ලදී.

මෙම අධ්‍යයනයේ දී දෙවුන්දර දේවාලය ආශ්‍රිත මේතාක් සංග්‍රහ නොකළ ජනශ්‍රැති විශාල ප්‍රමාණයක් සොයා ගන්නා ලදී. විශේෂයෙන්ම රාම රාවණ යුද්ධය ඇති වූයේ දෙවුන්දර බවට එන ජනශ්‍රැති සනාථ වන සාධක බොහොමයක් තිබේ. දෙවුන්දර

---

[1] සිංහල අධ්‍යයන අංශය, රුහුණු විශ්වවිද්‍යාලය, මාතර
ඊමේල්: dammikahewage@yahoo.com

දේවාලයට අධිගෘහිත දෙවියන් "විෂ්ණු" බව බහු ප්‍රචලිත ව ඇතත් උපුල්වන් යන ස්වදේශීක දෙවියන්ගේ දෙවොල දෙවුන්දර පිහිටා ඇති බවට බොහෝ සාධක හමුවේ. විවිධ දේව ලබ්ධිකයන්ගේ විවිධ දෙවිවරුන් දෙවුන්දර දේවාලයට ආරෝපණය කිරීමෙන් මෙම වියවුල්කාරී මතභේද හටගෙන ඇති බව පෙනෙයි. රාම රාවණ පුවත සම්බන්ධයෙන් ද දෙවුන්දර යම් සම්බන්ධයක් දක්වන බවත් උපුල්වන් දෙවි පමණක් නො ව විවිධ දෙවිවරුන්ගේ දේවාල පිහිටි "දේව නගරයක්" ලෙස අතීත දෙවුන්දර පැවති බවත් නිගමනය කළ හැකි ය.

**ප්‍රමුඛ පදඃ** දෙවුන්දර, උපුල්වන්, ජනශ්‍රැති
**Title:** Folklore relating to Devundara Upulvan devale
**Keywords:** Devundara, Upulvan, folklore